# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
# වාරිමාර්ග අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම, රාජ්‍ය - පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් (Public –Private- Partnership) ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තරව උසස් කීර්තිනාමයක් සහිත බාහිර ආයෝජකයෙකු සම්බන්ධ කර ගැනීම.**

## යෝජිත රාජ්‍ය -පෞද්ගලික හවුල් ව්‍යාපාරයේ පාර්ශවකරුවෙකු වීම සඳහා අභිලාෂයන් කැඳවීමට අදාළ අයදුම්පත්‍රය

| |
|---|
| |
| කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි |

### 1. පාර්ශවකරුවෙකු ලෙස ආයෝජනයට කැමැත්තක් දක්වන ආයෝජකයා/ ආයෝජන සමාගම පිළිබඳ තොරතුරු

1.1 ආයෝජකයාගේ / ආයෝජන සමාගමේ / ව්‍යාපාරයේ නම සහ ලිපිනය

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

* 1.2 ජාතික හැඳුනුම්පත් අංකය: ..........................................................................................

* 1.3 විදේශ ගමන් බලපත්‍ර අංකය: ......................................................................................

1.4 සමාගම ලියාපදිංචි අංකය: .........................................................................................

1.5 ව්‍යාපාර ලියාපදිංචි අංකය: .........................................................................................

1.6 දුරකථන අංකය: ..........................................................................................................

1.7 විද්‍යුත් තැපැල: ............................................................................................................

* 1.2 හා 1.3 කරුණු සමාගම් සඳහා අදාල නොවේ.

### 2. ඔබ විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතියෙහි ස්වභාවය

ඔබගේ පිළිතුර වචන සංඛ්‍යාව 1000 කට යටත්ව හා වම් පස ඉහල කෙලවරෙහි ඇමුණුම 01 ලෙස සඳහන් කර ඇමුණුමක් ලෙස අයදුම්පත සමඟ ඉදිරිපත් කරන්න.

(පුවත් පත් දැන්වීමෙහි හා මහවැලි වෙබ් අඩවියේ සඳහන් කොට ඇති **"වෙබ් සබැඳිය 02"** භාවිතා කොට **"වර්තමාන ඉඩම් පරිහරණ රටාව ඇතුලත් සැලසුම සහ අනාගත විභවතා සමඟින් බහුවිධ කාර්යයන් සඳහා සැකසූ ඉඩම් පරිහරණ සැලසුම"** බා ගත කර ගැනීමට පහසුකම් සලසා ඇත.)

| **3.** | **ඔබ විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිය මඟින් ආවරණය වන ක්ෂේත්‍ර** |
|---|---|

**ඔබගේ ව්‍යාපෘතිය මඟින් ආවරණය වන ක්ෂේත්‍ර ඉදිරියෙන් √ සලකුණ යොදන්න.**

| | | |
|---|---|---|
| 3.1 | පශු සම්පත් ක්ෂේත්‍රය | |
| 3.2 | ධීවර ක්ෂේත්‍රය | |
| 3.3 | පුණර්ජනනීය බලශක්තිය භාවිතය | |
| 3.4 | කෘෂි පාරිසරික සංචාරක ප්‍රවර්ධනය | |
| 3.5 | කෘෂි හා පශු සම්පත් පුහුණුව සඳහා ප්‍රදේශයේ තරුණ ප්‍රජාවට අවස්ථානුකූලව ප්‍රතිලාභ ලැබෙන ආකාරයෙන් පවත්වාගෙන යාම | |
| 3.6 | අපනයන ඉලක්ක කරගත් නිෂ්පාදන | |
| 3.7 | ආනයන ආදේශන නිෂ්පාදන | |
| 3.8 | අගය එකතු කිරීමේ නිෂ්පාදන | |
| 3.9 | නව තාක්ෂණික කෘෂිකර්ම හා සත්ව පාලන ක්‍රමවේදයන් භාවිතය | |
| 3.10 | වෙනත් ( සඳහන් කරන්න) ........................................................................................................................ | |

| **4.** | **පාර්ශවකරුගේ දල ආයෝජන සැලැසුම** |
|---|---|

4.1 ආරම්භක ප්‍රාග්ධන ආයෝජනය

- පුද්ගලික මුදල් ................................................................................
- බැංකු ණය ................................................................................

4.2 අපේක්ෂිත මුළු ආයෝජනය (කාල රාමුව සමඟ ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න.)

.................................................................................................................................................

4.3 අරමුදල් සපයා ගන්නා ආකාරය

4.3.1 දේශීය ආයෝජන

- පුද්ගලික මුදල් ................................................................................
- බැංකු ණය ................................................................................

4.3.2 විදේශීය ආයෝජන ................................................................................

- පුද්ගලික මුදල් ................................................................................
- බැංකු ණය ................................................................................

(මූල්‍ය ශක්තිය පෙන්නුම් කිරීමට අදාල ලිපිලේඛණ අමුණන්න)

## 5. වෙනත් ආයෝජන ව්‍යපෘති

5.1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හෝ වෙනත් ඕනෑම රාජ්‍ය ආයතනයකට අදාල ව්‍යපෘති සඳහා සම්බන්ධ වී තිබේද? ඔව් / නැත

5.2. පිළිතුර "ඔව්" නම් ඒ පිළිබඳ විස්තර

5.2.1. ආයතනය - ........................................................................................

5.2.2. ව්‍යාපෘතිය - ........................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

5.2.3. ආයෝජනය - ...................................................................................

## 6. රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු

I. ඔබ / ඔබ ආයතනය මෙම ව්‍යාපෘතිය සඳහා පාර්ශවකරුවෙකු ලෙස තෝරා ගතහොත් මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම නමින් ඇති වගකීම් සහ බැරකම් (ණයහිමි නොවන) පියවීමට හෝ බාර ගැනීමට යටත්ව අදියර දෙකක් යටතේ අවුරුදු 25ක කාල සීමාවක් සඳහා ගිවිසුම් ගත වනු ඇත.

II. පලමු අදියර ලෙස වසර 05 ක් සඳහා ගොඩනැගීම, පවත්වාගෙන යාම හා අදාළ කාල සීමාව අවසානයේ සමාගමේ පූර්ණ හිමිකම යළි මහවැලි අධිකාරිය වෙත ආපසු භාරදීමේ ක්‍රමවේදයට (Build – Operate – Transfer ) යටත්ව ගිවිසුම් ගත වන අතර පළමු අදියර ඇතුලත ඔබගේ /ඔබ ආයතනයේ යෝජිත ආයෝජනය සම්පූර්ණ කර වාණිජ මෙහෙයුම් ආරම්භ කල යුතුය.

III. පලමු අදියර තුලදී ඔබ /ඔබ ආයතනය විසින් යෝජනා කොට ඇති ව්‍යාපෘති යෝජනාව ආරම්භ කිරීම සඳහා සහනදායී කාල සීමාවක් ලෙස ප්‍රථම මාස 06 ක කාලයක් ලබා දෙනු ලබයි.

IV. එම ප්‍රථම මාස 06 කාල සීමාව තුලදී මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම මඟින් දැනට පවත්වා ගෙන යනු ලබන සියලු මෙහෙයුම් කටයුතු වල කළමණාකාරීත්වය ඔබ/ ඔබ ආයතනය විසින් පවත්වා ගෙන යාම සිදු කල යුතු වේ.

V. ඔබ / ඔබ ආයතනය විසින් ඉදිරිපත් කල ආයෝජන සැලැස්මෙහි පරිදි ඔබ / ඔබ ආයතනය විසින් සිදු කර ඇති ආයෝජනය පිළිබඳව අදාල අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත් කරනු ලබන තාක්ෂණික කමිටුවක් මඟින් වාර්ශිකව ඇගයීමකට ලක් කරනු ලබන අතර එම කමිටුව විසින් අවුරුදු 05ක කාල සීමාව අවසානයේදී සිදු කර ඇති සමස්ථ ආයෝජනය පිළිබඳව ප්‍රගති සමාලෝචනයක් සිදු කරනු ලබන අතර එහි ප්‍රථිපල මත දෙවන අදියරය ලෙස තවත් වසර 20 ක් සඳහා පලමු අදියර තුලදී අනුගමනය කල ක්‍රමවේදයට යටත්ව ගිවිසුමක් මඟින් ඔබ / ඔබ ආයතනය වෙත ලබා දීම සලකා බලනු ලබයි.

VI. ඉහත අංක V හි සඳහන් පරිදි සිදු කරනු ලබන ප්‍රගති සමාලෝචනයේදී, ඔබ / ඔබ ආයතනය විසින් ඉදිරිපත් කල ආයෝජන සැලැස්මෙහි පරිදි ආයෝජනය සිදු කොට නොමැති බව තහවුරු වන අවස්ථාවකදී පලමු අදියරයේදී ඇති කර ගත් ගිවිසුම අවලංගු වන අතර එවැනි අවස්ථාවකදී ඔබ / ඔබ ආයතනය දෙවන අදියර සඳහා සුදුසුකම් නොලබයි.

VII. දෙවන අදියරයේදී ඇති කර ගත් ගිවිසුම, කල් පිරීමේදී අවලංගු වන අතර මෙම ගිවිසුම තවදුරටත් දීර්ඝ කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී යලි සමාලෝචනයක් සිදු කර එකඟ වූ කාල සීමාවකට ගිවිසුම දීර්ඝ කිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මඟින් සිදු කරනු ලබයි.

VIII. වසර 25 ක කාල පරිච්ඡේදය තුල , ගිවිසුමට අනුව , ගිවිසුම් කාලය පුරාවටම වාණිජ ප්‍රතිලාභ භුක්ති විඳිමින් ව්‍යාපෘති පහසුකම් සැලසුම් කිරීම ,ක්‍රියාත්මක කිරීම , සම්පත් වෙන් කිරීම, අලෙවිකරණය, නඩත්තු කිරීම සහ අධීක්ෂණය කිරීම ඔබ / ඔබ ආයතනය වෙත පැවරී ඇත.

අංක 01 සිට 06 දක්වා වූ සියලු කරුණු කියවා බලා අවබෝධ කර ගතිමි. ඒ අනුව මා විසින් ඉහත සඳහන් කොට ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි.

......................                                        ........................................

දිනය                                        අයදුම්කරුගේ අත්සන

(සමාගමක් නම් අත්සන් තබන්නාගේ
මුලකුරු සමඟ නම හා තනතුර සඳහන් කරන්න.)

- **අයදුම්කරු ලෙස අත්සන් තබන්නේ සමාගමේ හිමිකරු/ ප්‍රධාන විධායක නිලධාරි නොවන විටක සමාගම වෙනුවෙන් මෙම අයදුම්පත අත්සන් කිරීමට බලය පැවරීමේ ලිපිය ඇමිණිය යුතුය.**

- **ඔබගේ අභිලාශයන් දැනුම්දීමේ අයදුම්පත තෝරාගතහොත් ඒ බව ලිඛිතව දැනුම් දෙන අතර ගොවිපල ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතුය.**
- **සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පල කරන මෙම දැන්වීමෙහි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලබයි.**
- **මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී රජය විසින් පනවා ඇති සහ ඉදිරියේදී පනවනු ලබන නීතිරීති හා අණපනත් වලට යටත්ව ක්‍රියාත්මක කල යුතු අතර මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතිය හා අවසන් තීරණය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.**